**කෝරළෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාව - 2023**
**-------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කෝරළෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට කෝරළෙයි පත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සභාවට සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.50,81ක්වූ පොත් 167ක වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | පරිත්‍යාග ලැබූ පොත් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.47,598,405ක් වූ ගිණුම් ශේෂ 06කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | වත්කම්වලට අදාල ලේඛන නඩත්තු කර දෝෂයන් නිවැරදි කරමින් පවතින බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගත යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | පසුගිය කාලපරිච්ඡේදයේ සභාවේ සන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය සම්බන්ධයෙන් ලබාදුන් රු.224,250ක අත්තිකාරම් 05ක් හඳුනාගෙන නිරවුල් කිරීමට වර්ෂ 05කට අධික කාලයක සිට පියවර ගෙන නොතිබුණි. | එකඟ වෙමි. අදාල කරුණ සම්බන්ධයෙන් අවධානය යොමුකර සුදුසු පියවර ගනිමින් පවතින බව | අත්තිකාරම් හඳුනාගෙන නිරවුල් කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | වර්ෂ 02කට වඩා වැඩි රු. 400,558 ක කල් ඉකුත් වූ තැන්පතු 04ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. සුදුසු පියවර ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,245,454 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 1,903,574ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,200,000 | 12,527,837 | 589,933 | 11,937,904 | 1,800,000 | 393,691 | 393,691 | 11,937,904 |
| කුලී | 7,375,369 | 7,470,046 | 6,953,493 | 516,552 | 7,808,877 | 6,400,693 | 6,678,734 | 1,044,310 |
| බලපත්‍ර ගාස්තු | 3,775,000 | 4,497,586 | 3,333,186 | 1,164,400 | 4,575,000 | 3,320,865 | 3,541,165 | 1,212,360 |
| වෙනත් ආදායම් | 5,593,000 | 3,970,441 | 3,970,441 | - | 18,380,000 | 49,545,087 | 46,043,661 | 3,501,426 |
| එකතුව | 18,943,369 | 28,465,910 | 14,847,053 | 13,618,856 | 32,563,877 | 59,660,336 | 56,657,252 | 17,696,000 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාලච්චේනෙයි කඩදාසි කර්මාන්ත ශාලාවෙන් වර්ෂ 25 කට අධික කාලයක සිට අයවිය යුතු වරිපනම් හා බදු ශේෂය රු.11,937,904 ක් විය. | එම කර්මාන්ත ශාලාවෙන් අයකර ගැනීම සඳහා දෙපාර්ත මේන්තු ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරි පියවර ගැනීමට නියමිත බව. | දීර්ඝ කාලීන හිඟවරිපනම් හා බදු නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ආදායම් ඉහළ නැංවීමේ අරමුණින් දේශීය ණය සංවර්ධන අරමුදලේ අරමුදල් සහ සභාවේ අරමුදල් උපයෝජනය කර 2017 වර්ෂයේ රු.10,950,000 කට මිලදීගත් එස්කැවේටර් යන්ත්‍රය (Excavator) ඇදගෙන යාම සඳහා සම්බන්ධිත ට්‍රේලරය මිලදී නොගැනීමෙන් | මෙම කරුණ සම්බන්ධයෙන් COPA හි පරිශීලනය කරමින් පවතින අතර මෙමගින් කිසිදු ආදායමක් ඉපැයිය නොහැකිවිය. එසේම, සභාවේ අයහපත් මූල්‍ය තත්ත්වය හේතුවෙන් ණය සඳහා මාසික වාරික ගෙවීමට නොහැකි තත්ත්වයක් පවතින බව. | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය ගෙවා අවසන් කිරීමට පියවර ගත යුතු අතර යන්ත්‍රය අදාළ අරමුණු සඳහා භාවිතා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | එය කුලියට ලබාදී ආදායම් ඉපැයීම වෙනුවට අරමුණට පටහැනි ලෙස සභාවේ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථාන යේ කාර්යයන් සඳහා පමණක් භාවිතා කර තිබුණි. එසේම, මෙම යන්ත්‍රය මිලදී ගැනීමට ලබාගත් ණය ආපසු ගෙවීමේ කාලය 2022 මාර්තු මාසයේ අවසන්ව තිබූ නමුත් පොලී ඇතුළුව රු.5,818,962ක් එම අරමුදලට ගෙවිය යුතු ව තිබුණි. | | |
| (ආ) | පළාත් සභා සහ පාලන අමාත්‍යාංශ යේ 2004 දෙසැම්බර් 08 දිනැති අංක PL/7/1/8/11 දරන චක්‍ර ලේඛය ප්‍රකාරව, කඩකාමර හෝ ව්‍යාපාරික ස්ථාන කුලියට හෝ බදුදීම හෝ පිළිබඳව පළාත් පාලන ආයතනවලට මාර්ගෝපදේශ උපදෙස් අංක 1.2(ඊ) ප්‍රකාරව කුලියට ලබාදෙන කඩකාමර කුලී වර්ෂ 05කට වරක් සංශෝධනය කළයුතු වුවත්, කඩකාමර 10ක කඩකුලී 2017 වර්ෂයෙන් පසුව සංශෝධනය කර නොතිබුණි. | කුලියට ලබාදෙන කඩකාමරවල කුලී මුදල තක්සේරු කර වර්ෂ 03කට වරක් කුලියට දීමේ ගිවිසුම් මත කුලියට ලබාදී ඇති බව. | කඩකාමර කුලී වටිනාකම සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෙනත් රාජ්‍ය ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබූ වාහන, ට්‍රේලර් සහ බවුසර් ඇතුළු වාහන 15ක් සභාව විසින් පරිහරණය කර තිබූ නමුත් සභාවට පවරා ගෙන නොතිබුණි. | පරිත්‍යාග ලැබූ වාහන සභාවට පවරා ගැනීම් කටයුතු සිදුකරන බව. | සභාව සතු වාහනවල අයිතිය නිරවුල් කරගත යුතුය. |
| (ආ) | පළාත් පාලන සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘතිය යටතේ සුදුපඩුත්තින හේන් ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ 2022 වර්ෂයේ රු.730,000ක් වැයකර ඉදිකළ වාහන අළුත්වැඩියා මධ්‍යස්ථානය සහ ඒ සඳහා රු.303,150ක් වැය කර මිලදීගත් මෙවලම් සහ උපකරණ 24ක් සභාව විසින් භාවිතා කර නොතිබුණි. | අදාල වාහන අළුත්වැඩියා මධ්‍යස්ථානය අංගසම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගනිමින් පවතින බව. | වත්කම් පූර්ණ වශයෙන් උපයෝජනය කිරීමට පියවර ගතයුතුය. |

### 3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ 2021 වර්ෂයේ සුදුපඩුත්තින සේන යන ස්ථානයේ ඝන | මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට මෙම සභාව දැරූ සියළුම ප්‍රයත්න අසාර්ථක වූ බව | ඝන අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් සම්පූර්ණ |

| | | |
|---|---|---|
| අපද්‍රව්‍ය වර්ගීකරණය කිරීමේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යය ප්‍රමාදවී ආරම්භ කිරීමෙන් එය අවසන් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම හේතුවෙන් රු.2,915,720ක් වැයකර එම ගොඩනැගිලිවල අත්තිවාරම් දැමීමේ කාර්යයන් පමණක් අන්‍යෝන්‍ය එකඟතාවයකින් අවසන්ව තිබුණි. | | කිරීමට පියවර ගතයුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවේ ප්‍රථමික මට්ටමේ පුරප්පාඩු 05ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු පුරප්පාඩු 03ක් වශයෙන් තනතුරු 08ක් පුරප්පාඩුවී පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | පුරප්පාඩු පිරවීමට සුදුසු ක්‍රියාමර්ග ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය සහ2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.6 ඡේදය ප්‍රකාරව සභාවේ සේවය කර මියගිය සහ ස්ථාන මාරුවීම් ලබාගිය අයගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.110,977ක් සහ රු.16,833ක හිඟ ණය ශේෂ වර්ෂ 02 සිට වර්ෂ 10ක් දක්වා කාලයක සිට අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟහිටි සේවක ණය අයකර ගැනිමට පියවර ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සකස් කළ වාර්ෂික අයවැය ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් 19ක් සඳහා වාර්ෂික අයවැය මගින් රු.215,550,000ක් ඇස්ත මේන්තු කර තිබූ නමුත් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා නොදීම තුළින් එම කාර්යයන් නිම කර නොතිබුණි. | පසුගිය වර්ෂවල පැවැති මූල්‍ය අර්බුද හේතුවෙන් අයවැය ඇස්තමේන්තු ප්‍රකාරව මූල්‍ය ප්‍රතිපාදන සලසාගත නොහැකිවූ බව | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිතව පැවැති ක්‍රියාකාරකම් 19ක් සඳහා ප්‍රතිපාදන සැලසීමට පියවර ගත යුතුය. |

**4.2 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1988 අංක 56 දරන පනතෙන් සහ 2000 අංක 53 දරන පනතෙන් සහ 2008 අංක 01 දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ ක්‍රියාත්මක වන රෙගුලාසිවලට අනුකූලව බේකරි 03ක් විසින් කල් ඉකුත් වූ පාරිසරික බලපත්‍ර අළුත්කිරීමට පියවර ගෙන නොතිබුණි. එසේම, ඉහත පනතේ රෙගුලාසි සහ 2022 ජනවාරි 27 දිනැති සහ 2264/18 අංක දරන විශේෂ ගැසට් පත්‍රයේ "ආ" වගන්තිය ප්‍රකාරව සත්ව ඝාතකාගාරය සඳහා පරිසර බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | අදාල පාර්ශවවලට උපදෙස් ලබාදී EPL ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කර ඇති බව. | පරිසර ආරක්ෂක බලපත්‍ර ලබා දීමට සහ අළුත්කිරිමට කටයුතු කළ යුතුය. |